ජයසිරි ජයසේකර
අංක 183/5
හයිලෙවල් පාර, කොළඹ 5.

2014 ඔක්තෝබර් 15

පොලිස්පතිතුමා,
පොලිස් මූලස්ථානය,
කොළඹ.

පොලිස්පතිතුමනි,

**<u>දුරකථනයෙන් ලැබුණ මරණ තර්ජන පිළිබඳව සිදුකරනු ලබන පැමිණිල්ලයි</u>**

වෘත්තියෙන් මාධ්‍යවේදියකු සහ මාධ්‍ය පුහුණු උපදේශකවරයකු වන මම ඉහත ලිපිනයේ පිහිටි ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනයේ විසින් මෙහෙයවන ගවේෂණාත්මක මාධ්‍යවේදීන් පුහුණු කිරීමේ වැඩසටහනක පුහුණු උපදේශකවරයකු ලෙස සේවය කරමි. මාගේ ජාතික හැඳුනම්පත් අංකය 720401819V වන අතර ජංගම දුරකථන අංකය 0777 316070 වේ.

ඉහත සඳහන් වැඩසටහන යටතේ පුහුණුව ලැබූ ජනමාධ්‍යවේදීන් පිරිසකට සහතික පත් බෙදාදීමේ උත්සවයක් සහ සුහද හමුවක් 2014 ඔක්තෝබර් මස 15 වන දින කොළඹ නාරාහේන්පිට ජානකී හෝටලයේදී පැවැත්වීමට නියමිතව තිබූ අතර, ඒ සඳහා සහභාගී වීමට ආරාධනා කළ සියලු මාධ්‍යවේදීන්ට ඒ පිළිබඳව නැවත සිහි කැඳවීමේ කෙටි පණිවුඩයක්, පසුගිය 13වැනිදා මගේ ඉහත සඳහන් ජංගම දුරකථන අංකය ඔස්සේ යැව්වෙමි.

2014 ඔක්තෝබර් 14වැනිදා සවස 5.10ට පමණ මගේ ඉහත දුරකථන අංකයට, 0756245489 දුරකථනයෙන් ඇමතූ පුද්ගලයෙක් ට්‍රාන්ස්පේරන්සි ආයතනයේ සේවයෙන් ඉවත් වන ලෙසත්, ඉහතකී වැඩමුලුව නොපවත්වන ලෙසත්, ඊට සහභාගී වීමට පැමිණියහොත් වධ හිංසාවට ලක්කර මා මරාදමන බවටත් තර්ජනය කළේය.

එහි දී ඔහු සිය අනන්‍යතාවය තහවුරු නොකළ අතර මා අදාළ වැඩසටහන පිළිබඳව පැහැදිලි කිරීමට උත්සාහ කළද ඒ කිසිවකට සවන් නොදෙමින් ඔහු දිගින් දිගටම මට තර්ජනය කළේය. එදිනම රාත්‍රී 7.38ට 072 5436266 දුරකථන අංකයෙන් මගේ ජංගම දුරකථනයට තර්ජනාත්මක SMS පණිවුඩයක් ලැබුණ අතර, එහි මෙසේ සඳහන් විය. "The Meeting which is organized for the Journalist in the Janaki Hotel on the 15th is the canceled do not attend for the LTTE meeting you will be attacked-RATA BERAGATH DESHAPREMI BALAKAYA"

මෙම තර්ජන හේතුවෙන් නියම කරගෙන තිබූ ස්ථානයේ වෙනුවට වෙනත් ස්ථානයක උත්සවය පැවැත්වෙමින් තිබියදී, 0112438359 අංකය දරන ස්ථාවර දුරකථනයෙන් මගේ ජංගම දුරකථනයට ඇමතූ පුද්ගලයෙක්, මා මේ මොහොතේ සිටින්නේ කොහේදැයි විමසා, මා ඔවුන් කී දේ නොතකා කටයුතු කර ඇති බැවින් මාත් මගේ බිරිඳ හා දරුවනුත් ඝාතනය කරන බවට ඉතා කුරිරු අන්දමින් තර්ජනය කළේය.

මෙම මරණ තර්ජනය මගින් මාගේ වෘත්තීය කටයුතු වලට මෙන්ම මාගේ ජීවිතයටද දැඩි අවධාවනමක් ඇතිවී තිබෙන බැවින් මගේ ජීවිතාරක්ෂාව තහවුරු කරන ලෙසත්, මේ පිළිබඳව නිසි

විමර්ශනයක් සිදුකර අදාළ තර්ජන සිදුකරන ලද පුද්ගලයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

ස්තුතියි.

විශ්වාසී,

……………………

ජයසිරි ජයසේකර